
# ශ්‍රී ලංකාව ජනාවාස වීම

# 10 ශ්‍රේණිය

## 02 පාඩම



නිපුණතාව :- මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම :- ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස වල මූලිකාංග අධ්‍යයනය කරමින් කාල අවකාශීය විවිධත්වය පෙන්වා දෙයි.

**සැකසුම : යූ. සුමිත්‍රා උඩුවරගේ**

**කෑ/දෙහි/ අංහෙට්ටිගම මහ විද්‍යාලය**

**අංහෙට්ටිගම.**

# ශ්‍රී ලංකාව ජනාවාස වීම

## 10 ශ්‍රේණිය - 02 පාඩම

---

### 2.1. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස

සාහිත්‍යය මූලාශ්‍ර මගින් විස්තර කෙරෙන අතීත කාලයේ ආරම්භයට පෙර යුගය ප්‍රාග් ඓතිහාසික යුගයයි. එම යුගයේ සංස්කෘතික අවධි දෙකකි.

- ගල් යුගය
- ශාක ආහාර මත යැපීම, ලෝහ භාවිතය, ස්ථිරවාසී ජනාවාස ආරම්භ වූ හෙවත් පූර්ව ඓතිහාසික යුගයයි.
- ශ්‍රී ලංකාව ජනාවාස කළ වර්තමාන මානවයා හෝමෝසාපියන්ය. ගල් යුගයේ සාක්ෂි හමුවන පළමු වැන්න රත්නපුර හා එහි අවට ප්‍රදේශයේ මැණික් පතල්ය. ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපයේ පොළවේ මැටි සහිත වැලි පස, ඒ බොරලු තට්ටුව ඉරණමඩු සැකැස්ම ලෙස හඳුන්වයි.

### විවිධ දේශගුණික කලාපවල ජනාවාස ව්‍යාප්තිය

- ප්‍රධාන පරිසර කලාප 06 කි.
    A. අර්ධ ශුෂ්ක කලාපය
    B. පහතරට වියළි කලාපය
    C. පහතරට අතරමැදි වියළි කලාපය
    D. තෙත් කලාපය
    E. කඳුකර අතරමැදි කලාපය
    F. ශුෂ්ක කලාපය

- **කාල වකවානු**
    - පාහියන්ගල - වසර 38000



ඡායාරූපය අංක 2.1 කළුතර දිස්ත්‍රික්කයට අයත් බුලත්සිංහල පාහියන්ගල පිහිටි මෙම ගල් ගුහාව මීට අවුරුදු 38 000 ඉහත කාලයක දී ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ වාසස්ථානයක් ව පැවතිණි. පාහියන්ගල ලෙන ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ ජීවිතය පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය කර තිබේ.

13

- ○ කුරුවිට බටදොඹලෙන - වසර 28000
- ○ කිතුල්ගල බෙලිලෙන - වසර 15000
- ○ බෙල්ලන් බැදි පැලැස්ස - වසර 12000

- **ජනාවාස වල මූලික ලක්ෂණ**

ප්‍රාග් ඓතිහාසික මානවයා එකිනෙකට වෙනස් පරිසර තත්ත්වයන්ට අනුවර්තනය වෙමින් ව්‍යාප්ත විය. වර්ෂා කාලයේ ගල් ගුහා වලත්, වියළි කාලයේ එළිමහන් තැන් වලත් ජීවත් විය.

ප්‍රාග් ඓතිහාසික එළිමහන් වාසස්ථාන හා ගල් ගුහා

01. මිනිහා ගල් කන්ද, බුන්දල, පතිරාජවෙල, වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන
02. පාහියන්ගල, බටදොඹලෙන, කිතුල්ගල, බෙලිලෙන, පහතරට තෙත් කලාපීය ලෙන්
03. සීගිරියේ පොතාන හා අලිගල පහතරට වියළි කලාපීය ලෙන්
04. බෙලලන්බැදි පැලැස්ස . තෙත් කලාපීය එළිමහන් වාසස්ථාන
05. බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න, කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන

- **ජීවන රටාව**

ජනගහනය කුඩා කණ්ඩායම් ලෙස ජීවත් විය. කණ්ඩායමක සාමාජිකයින් 15 - 25 ත් අතර ජීවත් විය. මියගිය ඥාතීන්ගේ මළ සිරුරු ගුහා ඇතුළත වල දැමූහ.

- **ආහාර රටාව**

ගවරා, කුළු මී හරකා, කළු වළහා, වල් ඌරා, ගෝනා, තිත්මුවා, මී මින්නා, ඉත්තෑවා, හාවා, දඬුලේනා, මිරිදිය මාළු වර්ග, වල්දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටු අල, ගොළුබෙල්ලන්

- ▪ ලුණු භාවිතය දක්නට ලැබේ

- **තාක්ෂණය**
  - ▪ ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් භාවිත විය. තිරිවානා හා කහඳ ගල් වලින් සකස් කර ඇත.
  - ▪ කැපීම, සීරීම, තැලීම, හැරීමට උචිත ලෙස සකසා ඇත.

- **මිනිසුන්ගේ ශරීරයේ ස්වභාවය**

සාමාන්‍ය වැඩුණු පිරිමියෙක් උස 174 cm වේ. කාන්තාවක් 166 cm කට වඩා උස් නොවීය.

- **අභිචාර විධි**
  - මිනී ඇට සැකිලිවල හිස් කබල් දෙකට බෙදා සිදුරු විද රළු පිටතට නෙරා ඇති කොටස් ගලක උලා එක පැත්තක රතු පැහැති ගුරු ගල් ආලේප කර ඇත. - රාවණා ඇල්ල ගුහාව
  - ඇටසැකිල්ල නවා වකුටු කර වළලා ඇත. - කුරුවිට බටදොඹ ලෙන

<u>**ඇගයීම**</u>

- හිස්තැන් පුරවන්න.

01. සාහිත්‍ය මූලාශ්‍ර වලට පෙර යුගය ..................................... යුගය නම් වේ.

02. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි 02 වන්නේ 1. .......................................................... හා ..................................... යි.

03. ශ්‍රී ලංකාව ජනාවාස කළ නූතන මානවයා ................................... නමින් හඳුන්වයි.

04. වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන ලෙස ............................................................. හා ................................................ දැක්විය හැක.

05. පින්තූරය අධ්‍යයනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



I. මේ පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?

II. මෙය අයත් යුගය නම් කරන්න.

III. මෙහි ජීවත් වූ ආදි මානවයා මීට වසර කොපමණ කාලයකට පෙර ජීවත් වූයේද?

IV. මෙය ශ්‍රී ලංකාවේ කිනම් කලාපයකට අයත්ද?

V. මෙය අයත් දිස්ත්‍රික්කය නම් කරන්න.

- පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.
  01. කඳුකර එළිමහන් දඩයම් වාසස්ථානයක් නම් කරන්න.
  02. ප්‍රාග් ඓතිහාසික යුගයේ කුඩා කණ්ඩායමක සිටි සාමාන්‍යය සාමාජිකයන් ගණන කීයද?
  03. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් ද්‍රව්‍ය 02 ක් ලියන්න.
  04. ක්ෂුද්‍ර ගල් මෙවලම් සකස් කළ පාෂාණ වර්ග 02 මොනවාද?
  05. ක්ෂුද්‍ර ගල් මෙවලම් වල ප්‍රයෝජන (කාර්යයන් ) සඳහන් කරන්න.
  06. ගල් යුගයේ දක්නට ලැබුණ අභිචාර විධි 02 ක් ලියන්න.

## ❖ පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස

ප්‍රාග් ඓතිහාසික යුගයේ අවසානයත්, ඓතිහාසික යුගයේ ආරම්භයත් අතර කාල පරිච්ඡේදයයි. මෙම යුගයේ පිළිස්සූ මැටි වළං භාවිතය ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි, යකඩ ලෝහ භාවිතය සුවිශේෂී ලක්ෂණයයි. ක්‍රි.පූ. 7000 - 4500 කාලයේ අයිස් යුගය අවසන ලෝකය උණුසුම් වී කෘෂිකර්මයට හිතකර පරිසර නිසා ජනගහනයද වර්ධනය විය.

පූර්ව ඓතිහාසික යුගයේ සාක්ෂි සබරගමුව ඊසාන දිග හා ඌව පළාතේ නිරිතදිගින් හමුවේ.

- මහාශිලා සුසාන - දඹුල්ල ඉබ්බන්කටුව, යාපහුව ගල්සොහොන් කනත්ත
- ශිලා මංජුසා සොහොන් - ගලේවෙල යටිගල්පොත්ත, බෙරගල, හල්දුම්මුල්ල, හරණි සුසාන
- මැටි ඔරු සුසාන - නිකවලමුල්ල - කොළඹගෙ ආර - ඌව පළාත - බෙරගල - හල්දුම්මුල්ල
- මැටි ඔරු සුසාන - සබරගමුව පළාත රත්නපුර දිස්ත්‍රික්කය කොළඹගෙ ආර රංචාමඩම - රජයේ විද්‍යාලය වර්තමානයේ දක්නට ලැබේ. පූර්ව ඓතිහාසික යුගයට අයත් වේ.

## ❖ ජනාවාසවල ස්වභාවය

- ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගා ගත්හ. එය ස්ථිරවාසිතාවයි.
- උඩ රංචාමඩම ආයත චතුරස්‍රාකාර හැඩයේ නිවස මීටර් 10.20 x 6.80 වරිච්චි බිත්ති මැටි, ඉලුක් සෙවිලි කර ඇත.

## ❖ ජීවන රටාව

පින්තාරු කළ මැටි බඳුන, සකපෝරුව භාවිතය, සත්ව ඇටකටු, මැටි පබළු, ඇස් අඳුන් ගෑ ලෝහ කුර, සිරුර වර්ණ ගැන්වූ කහ, රතු ගුරු ගල්, ඇඹරුම් ගල්

❖ **තාක්ෂණය**

ලෝහ තාක්ෂණය, මැටි බඳුන් තාක්ෂණය, ගිලා නොබසින ලෙස ගෙබිම සකස් කිරීම, පබළු නිෂ්පාදනය, මෙම යුගය යකඩ යුගය ලෙසද හඳුන්වයි.

**ඇගයීම.**

**01. පහත සඳහන් රූපය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

02. මෙය අයත් පළාත කුමක්ද?

03. මෙය අයත් දිස්ත්‍රික්කය නම් කරන්න.

04. මෙය වර්තමානයේ දක්නට ලැබෙන්නේ කොහේද?

05. මෙය භාවිතයට ගෙන ඇත්තේ කුමන යුගයකටද?

**02. සුසාන භූමි සම්බන්ධයෙන් පහත දී ඇති වගුව සම්පූර්ණ කරන්න.**

| සොහොන සොයාගත් ස්ථානය | සුසානයේ නම / ප්‍රදේශය |
|---|---|
| 1. දඹුල්ලට නුදුරුව සොයාගත් සොහොන | ................................................................ |
| 2. යාපහුවේ සොයාගත් සොහොන | ................................................................ |
| 3. ගලේවෙල නුදුරුව පිහිටි සොහොන | ................................................................ |
| 4. ඌව පලාතෙන් හමු වූ සුසාන භූමියේ ප්‍රදේශය වන්නේ | ................................................................ |

03. පූර්ව ඓතිහාසික යුගය යනු කුමක්ද?

04. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වී පෙනෙන කරුණු 03 ක් ලියන්න.

05. "පූර්ව ඓතිහාසික යුගය" "යකඩ යුගය" ලෙස හඳුන්වන්නේ ඇයි?

## මුල් ඓතිහාසික යුගයේ ජනාවාස

ක්‍රි.පූ 450 සිට ක්‍රි.ව. 300 කාල පරිච්ඡේදයේ කුඩා ගම් වැව් දක්නට ලැබිණ.

ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක වාර්ෂික වර්ෂාපතන අගය, පසේ ස්වභාවය, භූ විෂමතාවය, ස්වභාවික සම්පත් ව්‍යාප්තිය, ජලවහනය සාධක ලෙස දැක්විය හැක. මෝසම් වර්ෂා ජලයෙන් වගා කළ අතර ගංවතුර පාලනය සඳහා අමුණු බැන්දහ.

ක්‍රි.ව. 1 සියවසේ ඉළනාග රජු තිස්සමහාරාම වැව ඉදි කළා, කුරුණෑගල ගනේකන්ද විහාරයේ බ්‍රාහ්මී අක්ෂර ආවරණ - අමුණ යන්නයි.

## ජනාවාස ව්‍යුහය හා ස්වරූපය

මහා වංශයට අනුව - සුමනවාපිගාම
- විහාරවාපිගාම
- හුන්දරීවාපිගාම
- කඩහවාපිගාම

❖ වංශකතා වල හා සෙල්ලිපි වල සඳහන් ගම් 7 වෘත්තිකයින් අනුව වෙන් කළා.

- කසීකාරගාම - ගොවියන් විසූ ගම්
- මණිකාරගාම - මැණික් කැපූ හා ගැරූ අය විසූ ගම්
- ගෝපාලගාම - ගොපල්ලන් විසූ ගම්
- කේවට්ටගාම - ධීවරයින් විසූ ගම්
- කුම්භකාරගාම - වළං සාදන්නන් විසූ ගම්
- වඩ්ඩකීගාම - වඩුවන් විසූ ගම්
- කාර්යයන් අනුව ගම් වර්ග කිහිපයකි.
  - පට්ටානගාම - වරාය
  - නියම්ගම් - වෙළඳ ගම්
  - ඔළගම් - ජනතාව අතහැර දැමූ ගම්

සාහිත්‍ය මූලාශ්‍ර වලට අනුව ඇතැම් ගම් වැටකින් ආරක්ෂා කර තිබිණ. එවැනි ගම් පරික්ඛිත්ත ගම් ලෙස හැඳින්වීය. එවැනි ආරක්ෂාවක් නොමැති ගම් අපරික්ඛිත ගම් ලෙස හැඳින්වීය. විශාල නගර "පුර" විය. පුර කමත යනු නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියාය.

- *I* වන විජයබාහු රජතුමාගේ පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය "නුරුපුර" ලෙස ව්‍යවහාර කර ඇත.
- ගමත්, පුරයත් අතර ජනාවාස - නගර ලෙස හැඳින්විය.

  - පවුල නියෝජනය කළේ - ගෘහපතීන්ය.
  - ගමේ ප්‍රධානියා - ගමිකය.
  - දඹුල්ල කළුදිය පොකුණ සෙල්ලිපියට අනුව - දසගම් ඇත්තන්ගෙන් සමන්විත මණ්ඩලය පිළිබඳ සඳහන් වේ.

**යැපීම් ක්‍රමය**

ප්‍රධාන යැපීම් ක්‍රමය හේන් ගොවිතැනයි.

**ඇගයීම්**

01. පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකා ගංගා ආකෘති සිතියමක ලකුණු කරන්න.
(අනුරාධපුරය, පොළොන්නරුව, මාගම, මිනිහාගල් කන්ද, පතිරාජවෙල, බුන්දල)
02. පුරාණ ජනාවාස ව්‍යාප්තියට බලපෑ ප්‍රධාන සාධක මොනවාද?
03. පැරණි ජනාවාස ඇත්තන් අමුණු ඉදි කිරීමට තුඩු දුන් හේතු දෙකක් ලියන්න.
04. "අවරණ" යනු කුමක්ද?
05. මහාවංශයේ සඳහන් වාපිගාම 02ක් ලියන්න.
06. පහත වගුවට අනුව විවිධ වෘත්තිකයින් විසූ ගාම නම් කරන්න.

| ග්‍රාමය | වෘත්තිකයින් |
|---|---|
| ........................................................... | ගොවියන් විසූ ගම් |
| ........................................................... | මැණික් ගැරූ හෝ කැපූ අය විසූ ගම් |
| ........................................................... | ගොපල්ලන් විසූ ගම් |
| ........................................................... | ධීවරයින් විසූ ගම් |
| ........................................................... | වලං සාදන්නන් විසූ ගම් |
| ........................................................... | වඩුවන් විසූ ගම් |
| ........................................................... | වරාය ආශ්‍රිත ගම් |
| ........................................................... | වෙළඳ ගම් |
| ........................................................... | ජනතාව අතහැර දැමූ ගම් |

07 "පරික්ඛිත්ත" "අපරික්ඛිත්ත" ගම් කෙටියෙන් හඳුන්වන්න.
08. "නුරුපුර" ලෙස නම් කළ නගරය කුමක්ද?
09. ගමේ ප්‍රධානියා නම් කරන්න.
10. දස දෙනෙකුන් සමන්විත මණ්ඩලය සෙල්ලිපි වල හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?